## විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් ගාස්තු සංශෝධනය

1981 අංක 04 දරණ කොන්සියුලර් කටයුතු පනත යටතේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් (ප්‍රදූත) අංශය මගින් අයකරනු ලබන ගාස්තු 2018 ජනවාරි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කර ඇත.

මේ අනුව සංශෝධිත කොන්සියුලර් ගාස්තු පහත පරිදි වේ.

a) විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද විභාග සහතිකයක් සඳහා රු.500.00
b) විදේශ ජාතිකයෙකුට ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ඕනෑම සහතිකයක් සඳහා රු.1500.00
c) අපනයන කටයුතු ඉටු කිරීම සඳහා නිකුත් කරන ලද ඕනෑම ලේඛනයක් සඳහා රු.6000.00
d) වෙනත් ඕනෑම ලේඛනයක් සඳහා රු.800.00

ගාස්තු සංශෝධනයට අදාළ ගැසට් නිවේදනයට පහත සබැඳියෙන් පිවිසිය හැකිය.

http://www.documents.gov.lk./files/egz/2017/11/2044-39_S.pdf

අවසන් වරට කොන්සියුලර් ගාස්තු සංශෝධනය කරනු ලැබුවේ 2007 ජූලි මාසයේදීය.

මහජනතාව වෙත ඉතා කාර්යක්ෂම හා ඵලදායී ලෙස කොන්සියුලර් සේවාවන් සැපයීම සඳහා නවීන ඩිජිටල් තාක්ෂණය උපයෝගී කර ගන්නා බව විදේශ කටයුතු අමාත්‍යාංශය සතුටින් දැනුම් දෙයි.

http://www.mfa.gov.lk/index.php/en/consular-services/authentication-of-documents යන අන්තර්ජාල සබැඳිය ඔස්සේ ලේඛන සත්‍යාපනය කිරීම සම්බන්ධ වැඩිදුර තොරතුරු ලබාගත හැකිය.

කොන්සියුලර් අංශය මඟින් සපයන සේවාවන් පිළිබඳ වැඩිදුර විස්තර

***කොන්සියුලර් කටයුතු අංශය***
*දෙවන මහල, සෙලින්කෝ ගොඩනැඟිල්ල*
ජනාධිපති මාවත
කොළඹ 01 - යන ලිපිනයෙන් හෝ
දුරකතන අංක: 0112338812 ( සඳුදා සිට සිකුරාදා - පෙ.ව. 8.30 සිට ප.ව.4.15 දක්වා)
ෆැක්ස් අංක: 0112473899 හෝ
consular@mfa.gov.lk යන විද්‍යුත් ලිපිනය ඔස්සේ හෝ ලබාගත හැකිය.

විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ

2017 නොවැම්බර් මස 30 වැනිදා